# සෙන් බොදු කතා - පර්සි ජයමාන්න

## ඒකත් එහෙමද?

හකුයින් කියන සෙන් ගුරුවරයා පිරිසිදු ජීවිතයක් ගත කළ අයෙකු ලෙස ප්‍රකටව සිටියා. ඒ නිසා බොහෝ දෙනා ඔහුට ගෞරව කළා.

ඒ ළගපාත ලස්සන ජපන් තරුණියක් ජීවත් වුණා. ඇගේ දෙමාපියන් ධනවත් අය.
තාත්තා පොහොසත් මුදලාලි කෙනෙක්. හදිසියේ ම ඒ දෙමාපියන්ට දැන ගන්න ලැබුණා, ඒ තරුණිය මවක් වෙන්න යන බව.

මේක අහලා ඒ දෙමාපියන්ට හොඳටෝම තරහ ගියා. ඔවුන්ට දැන ගන්න ඕනැ වුණා දරුවගෙ තාත්ත කවුද කියල දැන ගන්න. ඒත් ඇය කියන්න කැමති වුණේ නෑ. අන්තිමේ දී නොයෙකුත් තාඩන පීඩන කරලා ඇයගෙන් අහ ගත්තා, දරුවගේ පියා කවුද කියලා. ඒ තමා හකුයින්.

දෙමාපියන් ඒක අහපු ගමන්ම තරහෙන් පිපිරි පිපිරි එතුමා හමුවෙන්න ආරාමයට ගියා. ඔවුන් කී සියල්ල



එතුමා නිහඬව අහගෙන හිටියා.

අවසානයේ දී එතුමා මෙහෙම කිව්වා
"ඒකත් එහෙමද?"

"ඒකත් එහෙමද කියල හරියන්නෙ නෑ. අපි දරුවා ලැබුණාම ඔබට ගෙනත් දෙනවා." දෙමාපියන් යන්න ගියා.

දරුවා උපන්නාට පස්සෙ ඔවුන් දරුව ව අර ගෙන ගිහින් සෙන් ගුරුතුමාට බාර දුන්නා. ඔවුන් එතුමාට කළේ ලොකු ලැජ්ජාවක්. එතුමාගේ පිරිසිදු ජීවිතයට ලොකු කැලලක් සිදු වුණා. ඒත් එතුමා එයින් මඳක්වත් සැලුණේ නෑ. කිසිත් මුවින් නොබැණ දරුවාව බාර ගත්තා. අසල්වාසීන්ගෙත් උදවු ඇතුව ඒ දරුවාට කිරි ලබා දුන්නා. ඒ විතරක් නෙමෙයි, අවශ්‍ය හැම දෙයක්මත් ලබා දීලා දරුවාව හොඳින් හදා වඩා ගත්තා.

අවුරුද්දක් විතර ගත වුණා. දරුවගෙ අම්මට දරුවා නැතුව තවදුරටත් ජීවත්වෙන්න බැරි තරම් දරු කැක්කුමක් ආවා. ඇය අවසානයේ දී ඇත්ත හෙළි කළා. ඒ දරුවාගේ ඇත්ත පියා මාළු වෙළෙඳ පොළේ තරුණයෙක්.

ඒක අහපු ගමන් ම ගෑනු ළමයාගෙ අම්මත් තාත්තත් ගියා, ආරාමයට. ගුරුතුමා හමු වෙන්න. ගිහින් වැඳ වැටිලා අනේක වාරයක් සමාව ඉල්ලුවා, තමන් අතින් වුණු වැරැද්දට. සමාව ඉල්ලල දරුවාව ආපහු ඉල්ලුවා.

හකුයින් ගුරුතුමා ඒ ඉල්ලීමට එකග වුණා. දරුවාව ආපහු දෙන ගමන් කිවේ "ඒකත් එහෙමද? "කියල විතරයි.

## සොරකම් කරනු බැරි සඳ

රියෝකාන් සෙන් ගුරුවරයෙක්. කන්දක් පාමුල පිහිටි පුංචි පැලක වී ඔහු ගත කළේ ඉතාමත් සරල ජීවිතයක්. එක් හැන්දෑවක හොරෙක් ඒ පැලට රිංගුවා මොනව හරි හොරකම් කරන්න හිතා ගෙන. ඒත් කිසි දෙයක් තිබුණේ නෑ.

ඒ අතර රියෝකාන් ආවා. හොරා අතට ම අහුවුණා.

"ඔබ හුගක් දුර ඉඳන් වෙන්න ඇති මාව හොයා ගෙන ආවෙ?" ඔහු හොරාට කීවා. "ඔබ මෙච්චර දුර ඇවිල්ල



හිස් අතින් යන එක හරි නෑ. ඒ හින්දා මං මේ ඇඳන් ඉන්න ඇඳුම තෑග්ගකට ගන්න."

අන්දුන්කුන්දුන් වූ හොරා ඒ ඇඳුමත් අරගෙන එතැනින් ඉක්මනට ම මාරු වුණා.

රියෝකොන් නිරුවතින් වාඩි වී සිටියා. ඔහුට හඳ පායා ඇවිත් තිබෙනු දැකිය හැකි වුණා.

"අහිංසකයා, මට මේ ලස්සන හඳ එයාට දෙන්න පුළුවන්කමක් තිබුණා නම්" ඔහු තමාට ම කියා ගත්තා.

පර්සි ජයමාන්නකගේ සෙන් බොදු කතා ග්‍රන්ථයෙනි.


Kandy

**House for Sale**

6 Bedroom luxury house with a panoramic view in Kandy

I km away from new court complex
All bedrooms have attached bathrooms
Double garage
Rooftop garden
Security system with CCTV

**32 million rupees or nearest Offer**

0094777386070 / 0094778659358
raviwithanarachchi@yahoo.com





## අඳුරු වළා අතරේ රිදී රේඛාවක් - සිංහලෙන් පැය දෙකක්

මෙල්බන් නගරය තරම් සිංහල ජනමාධ්‍ය ක්ෂෙත්‍රයේ විහිලු සපයන මිනිසුන්ගෙන් පිරුණු තැනක් මේ ලෝකයේම නැත. වියරණ නොවරද්දා වචන දහයක් එක දිගට ලියාගත නොහැකි මිනිසුන් ලේඛකයන් ලෙස තමන්ම බෞතීස්මය ලබා ගනිද්දී සිංහල වචන දහයක් නිවැරදිව කතා කරග ගත නොහැකි මිනිස්සු නිවේදකයන් ලෙස පෙනී සිටිමින් ස්වයං වින්දනයක් ලබා ගනිති. ඒ අතරේ මුදල් ගෙවා අනුන් ලවා කරවාගන්නා නිර්මාණ වලට තමන්ගේ නම ගසාගන්නා විලිලැජ්ජාවක් නැති මිනිසුන් ය.

මේ සියල්ල අතරේ සිංහල ජනමාධ්‍ය පිලිබඳ සිතට සතුටක් ඇතිකරන පුවතක් ඉඳ හිට හෝ අසන්නට ලැබීමත් ඒ ගැන කතා කරන්නට ලැබීමත් භාග්‍යයකි. මෙල්බන් නුවර 97.1 FM ඔස්සේ විකාශය වන 3MDR ගුවන් විදුලියේ සිංහල වැඩසටහන - සිංහලෙන් පැය දෙකක් - 2012 වසරේ ඔස්ට්‍රේලියාවේ විශිෂ්ටතම වාර්ගික ගුවන් විදුලි වැඩසටහන හිමි සම්මානයෙන් පිදුම් ලැබීමේ පුවත අප සිතේ ඇති කරන්නේ අති මහත් සතුටකි.

මේ වැදගත් පුවත හෙළිදරව් කරන්නට සිංහලෙන් පැය දෙකක් කණ්ඩායම සංවිධානය කළ රැස්වීම මෑත භාගයේ මෙනුවරදී අත් විඳි සුන්දරම අවස්ථාවක් ලෙස සටහන් කර තබන්නට කැමැත්තෙමි.

ඔවුන්ට තමන්ගේ වැඩසටහන ගැන ස්මරණය කරන්නට කතා කරන්නට බොහෝ දේ තිබුණි. ඒ කතාව කරන්නට ඒ කතාව අපට කියන්නට ඉතා ශක්තිමත් පදනමක් ඔවුනට විය. ඔවුහු 2012 වසරේ ඔස්ට්‍රේලියාවේ විශිෂ්ටම වාර්ගික ගුවන් විදුලි වැඩ සටහන ඉදිරිපත් කළ දක්ෂයෝ ය. එය සමස්ථ ශ්‍රී ලාංකික ප්‍රජාවම එකට එක්වී සැමරිය යුතු අගය කළ යුතු ජයග්‍රහණයකි.

ආසාව තිබූ පමණින් සාර්ථක ගුවන්විදුලි වැඩසටහනක් ඉදිරිපත් කරන්නට කිසිවකුට හැකියාවක් ලැබෙන්නේ නැත. ඒ සඳහා අභ්‍යාසයෙන් වර්ධනය කරගත් හැකියාවක් මෙන්ම ඒ පිළිබඳ දැනුමක් සහ අවබෝධයක් ද තිබිය යුතු ය. තමන් කරන වැඩසටහන මිනිසුන් අසා සිටින බවත් ඒ මිනිසුන් තමන්ගේ හැකියාව හා නොහැකියාව පිළිබඳ තක්සේරුවකට පැමිණෙන බවත් දැන සිටිය යුතු ය. තමන්ගේ බුද්ධිමත් බව හෝ මුග්ධ බව හෝ තමන්ගේ වැඩස-ටහන තුළින් ප්‍රදර්ශනය වන බවත් දැන සිටිය යුතු ය.

ඕනෑම වැඩසටහනකින් පිළිබිඹුවන්නේ ඒ පිටුපස සිටින්නන්ගේ බුද්ධිමත් බවයි. බුද්ධිමත්බව යනු කඩදාසි සහතික නොවේ. පොත පතින් ස්වයං අධ්‍යයනයෙන් එක්රැස්කරගත් දැනුමයි. ඒ දැනුම නිර්මාණශීලී ලෙස ඉදිරිපත් කරන්නේ කෙසේදැයි දක්ෂයෝ දනිති.

සිංහලෙන් පැය දෙකක් කණ්ඩායමේ සාදයේදී චරිත දිසානායක සොහොයුරා වැදගත් කතාවක් කීවේ ය. සදාකාලිකව මේ ගුවන් විදුලිය අල්ලාගෙන සිටීමේ තෘෂ්ණාවක් අපට නැහැ. අලුත් කණ්ඩායමකට ඉඩ දී දවසක අපි මෙයි-න් ඉවත්වෙනවා. සියල්ල බදාගෙන සිටීමේ තෘෂ්ණාවෙන් වෙළී සිටිනා මිනිසුන්ට මෙය වැදගත් පණිවුඩයක් නොවේ ද?

සිංහලෙන් පැය දෙකක් ගුවන් විදුලි වැඩසටහන ගෙන එන චරිත දිසා-නායක, ලසන්ත බෝයගම, දිල්රුක්ෂි විජේසූරිය, උත්පල ප්‍රේමවර්ධන, මධූ තලගල, දිලූප ද සිල්වා ඇතුළු පිරිසට අපේ සුබපැතුම්.


